Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# පිළියන්දල අධ්‍යාපන කලාපය
# Piliyandala Education Zone

8 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය - 2024

ඉතිහාසය I , II

පැය දෙකයි
Two Hours

නම :-

## I කොටස

✍ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) අනුරාධපුර සමයේ වසභ රජතුමා විසින් ඉදිකරන ලද වැවකට උදාහරණයක් වන්නේ,

(i) බානු වාපි (ii) පාඳුලක වාපි (iii) මහාදත්තවාපි (iv) මහවිලච්චිය

(02) වැවක ජලය මනා පාලනයකින් යුතුව පිටතට ගැනීම සඳහා කරන ලද නිර්මාණය වන්නේ,

(i) බිසෝකොටුව (ii) පිටවාන (iii) සොරොව්ව (iv) ඇතුළුවාන

(03) මිනිසාගේ පරිහරණයට මෙන්ම අලංකාරය සඳහා තැනවූ පොළොන්නරු යුගයේ පොකුණකට උදාහරණයක් වන්නේ,

(i) කුට්ටම් පොකුණ (ii) නෙළුම් පොකුණ
(iii) ඇත් පොකුණ (iv) රන්මසු උයන් පොකුණු

(04) දිවයිනේ මුල්වරට තනවන ලද උද්‍යානය වූ මහමෙවුනා උයන මිහිඳු හිමියන් ඇතුළු මහා සංඝයාට පූජා කළ රජතුමා වන්නේ,

(i) මුටසීව රජතුමා (ii) පණ්ඩුකාභය රජතුමා
(iii) දේවානම්පියතිස්ස රජතුමා (iv) කුටකණ්ණතිස්ස රජතුමා

(05) පහත 'අ' තීරුව සමඟ 'ආ' තීරුව ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර වන්නේ,

| | ' අ ' | | 'ආ ' |
|---|---|---|---|
| (1) | ඇලහැර ඇල | A | මහසෙන් රජතුමා |
| (2) | තල්වතු ඇල | B | වසභ රජතුමා |
| (3) | යෝධ ඇල | C | I අග්ගබෝධි රජතුමා |
| (4) | මිනිපේ ඇල | D | ධාතුසේන රජතුමා |

(i) A B D C (ii) B A D C (iii) C D B A (iv) D A B C

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

(06) මධ්‍යම නුවරගම් පළාතේ ගල්කඩවල නම් ග්‍රාමයේ නව ගඩොල් පෝරණුවක් ඉදිකොට අලුතින් ගඩොල් තැනීම සිදුකළේ ................................................................. ප්‍රතිසංස්කරණ කටයුතු සඳහාය.

( රුවන්වැලිසෑය / ජේතවන දාගැබ )

(07) මෙරට රන් කර්මාන්තය පැවති බවට සාක්ෂි දක්වමින් 1994 වසරේ පොකුණක් කැනීම් කිරීමේදී විවිධ බරින් යුතු රන් කැබලි 5 ක් ලැබුණු ස්ථානය වන්නේ ................................................ .......................................................... ය. ( අභයගිරි විහාර භූමිය / සමනල වැව ප්‍රදේශය )

(08) සාහිත්‍ය මූලාශ්‍ර වලට අනුව මෙරට ඉදිවූ මුල්ම දාගැබ ...................................................... යි.

( අභයගිරිය / ථූපාරාමය )

(09) ප්‍රමාණයෙන් කුඩා දාගැබ් ආවරණය කිරීම සඳහා තැනූ ගෘහය ...................................................... යි.

( චෛතියඝර / බෝධිඝර )

(10) පොළොන්නරු යුගයට අයත් පැරණිම රජ මාලිගය වනුයේ ..........................................................

( විජයබා මාලිගය / වෛජයන්ත ප්‍රාසාදය )

- **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් දී ඇති ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

(11) උඩරට රාජධානියේ ආරම්භක පාලකයා වන්නේ සේනාසම්මත වික්‍රමබාහු රජුය. ( )

(12) උඩරට පාලකයා වූ ජයවීර බණ්ඩාර රජුගෙන් පසු ඔහුගේ පුතකු වූ කරලියැද්දේ බණ්ඩාර උඩරට පාලකයා බවට පත්විය. ( )

(13) II රාජසිංහ රජතුමා විසින් 1594 දී දන්තුරේ සටනින් පෘතුගීසීන් අන්ත පරාජයකට පත් කළේය. ( )

(14) ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ කාලයේ දී වැලිවිට සරණංකර හිමියෝ රජුට අවශ්‍ය අනුශාසනා ලබා දෙමින් බෞද්ධ පුනරුදයේ පුරෝගාමියා ලෙස ක්‍රියා කළහ. ( )

(15) පිළිමතලව්වේ මහඅධිකාරම්ගේ සහාය ඇතිව කන්නසාමි කුමරා 1798 දී ශ්‍රී වික්‍රම රාජසිංහ නමින් උඩරට රජ විය. ( )

- **ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර ලියා දක්වන්න.**

(16) යුරෝපා පුනරුදය මුලින්ම ආරම්භ වූ රට වන්නේ ...................................................................... යි.

(17) ඉස්ලාම් භක්තිකයන් වූ තුර්කි ජාතිකයන් විසින් ක්‍රි.ව. 1453 දී යටත් කරගනු ලැබූ යුරෝපා ප්‍රධාන වෙළඳ නගරය වූයේ ...................................................................................................... යි.

(18) ඉතාලියේ ප්ලෝරන්ස් නගරයේ කලාත්මක කටයුතු වලට අතහිත දුන් ධනවත් පවුලක් වන්නේ ........................................................................... පවුලයි.

(19) ඉතාලියේ .......................................... නගරය පුනරුද සමයේ නව චිත්‍ර කලාවක් බිහි කළ මධ්‍යස්ථානය විය.

(20) ඉතාලි ජාතික ....................................................................... චිත්‍ර ශිල්පියෙකු, ගෘහ නිර්මාණ ශිල්පියෙකු , ඉංජිනේරුවකු , කවියකු මෙන්ම සංගීතඥයකු විය.

(ල. 2 x 20 = 40)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**8 ශ්‍රේණිය - ඉතිහාසය**

**II කොටස**

- **පළමු ප්‍රශ්නයට පිළිතුරු ලිවීම අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නයට අමතරව තවත් ප්‍රශ්න 4 ක් තෝරාගෙන පිළිතුරු සපයන්න.**

(01) (i)



A. රූපයෙන් දැක්වෙන මෙම ස්ථානය නම් කරන්න.

B. මෙය කරවූ රජතුමා කවුද ?

C. මෙම ස්ථානය කැනීම් කළ පුරාවිද්‍යාඥයෙක් නම් කරන්න.

D. මෙහි ජල තාක්ෂණයට අදාළ අංගයක් ලියන්න.

(ii)



A. රූපයෙන් දැක්වෙන රජතුමා නම් කරන්න.

B. මෙතුමා රජ වීමට පෙර නම කුමක්ද ?

C. මෙතුමා රජකම නීත්‍යානුකූල කරගැනීම සඳහා විවාහ කරගත් කුමාරිකාව කවුද ?

D. 1602 පෘතුගීසීන්ට එරෙහිව සිදුකළ සටනක් නම් කරන්න.

(iii)



A. මෙය නම් කරන්න.

B. මෙම රජ මාලිගාව අයත් වූ රජතුමා කවුද ?

C. මෙහි ගොඩනගා තිබූ මහල් ගණන කීයද ?

D. මෙයට සමාන කුඩා මාලිගයක නටබුන් හමුවූ ස්ථානය කුමක්ද ?

(iv)



A. මෙය නම් කරන්න.

B. මෙය කරවූ ශිල්පියා කවුද ?

C. ඔහු කුමන ජාතිකයෙක්ද ?

D. මෙතුමාගේ තවත් විශිෂ්ට චිත්‍ර නිර්මාණයක් ලියන්න.

(ල. 4 x 4 = 16)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(02) (i) රජරට ශිෂ්ටාචාර සමයේ පිළිම ගෙවල් නිර්මාණය කළ ප්‍රධාන සම්ප්‍රදායන් 2 ක් ලියන්න. (ල. 2)

(ii) මහවැව් තැනීමේදී ලාංකිකයන් ලැබූ ජයග්‍රහණ 2 ක් ලියන්න. (ල. 4)

(iii) වැවක කොටස් 3 ක් නම්කර ඉන් දෙකකින් සිදුවන කාර්යය පැහැදිලි කරන්න. (ල. 5)

(03) (i) උඩරට රාජධානිය හඳුන්වන වෙනත් නම් 2 ක් ලියන්න. (ල. 2)

(ii) II රාජසිංහ රජු සමයේ වැදගත්කමට අදාළව කරුණු 2 ක් ලියන්න. (ල. 4)

(iii) ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා පිළිබඳ වාක්‍ය 5 ක් ලියන්න. (ල. 5)

(04) (i) උඩරට රාජධානියේ කුඹුරුවල වී වගාව සිදුකළ ආකාරය හඳුන්වන නම කුමක්ද ? (ල. 2)

(ii) උඩරට රාජධානි සමයේ අපනයනය කළ වෙළඳ ද්‍රව්‍ය 4 ක් ලියන්න. (ල. 4)

(iii) උඩරට රාජධානියේ සමාජය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ල. 5)

(05) (i) පුනරුදය යනු කුමක්ද ? (ල. 2)

(ii) පුනරුද සමයේ සාහිත්‍ය කලා නිර්මාණ බිහි කළ ගත් කතුවරු දෙදෙනෙකු නම් කරන්න. (ල. 4)

(iii) පුනරුදය ඇතිවීමට බලපෑ හේතු 3 ක් විස්තර කරන්න. (ල. 5)

(06) (i) පුනරුද සමයේ පල්ලිය විවේචනය කළ කණ්ඩායම හැඳින්වූ නම කුමක්ද? (ල. 2)

(ii) පුනරුද සමයේ ගොඩනැගිලි නිර්මාණය තුළ කැපී පෙනුණු ලක්ෂණ 2 ක් ලියන්න. (ල. 4)

(iii) අතීතයේ මෙරට මැටි භාජන තැනීම සඳහා භාවිතා කළ මූලික පියවර සියල්ල නම් කරන්න. (ල. 5)

(07) (i) පැරණි වැව් තැනීමේදී

a) වැව් බැම්ම සේදී යාම වැළැක්වීමට ඉදිකළ තාක්ෂණික අංගය නම් කරන්න.

b) වෙනත් ජල මූලාශ්‍රයකින් එන ජලයේ රොන්මඩ ඉවත්කර වැවට ජලය සම්බන්ධ කරන අංගය නම් කරන්න. (ල. 2)

(ii) පැරැන්නෝ පොකුණු තැනවීමෙන් බලාපොරොත්තු වූ දේවල් 2 ක් ලියන්න. (ල. 4)

(iii) පැරැන්නෝ වැව් බැම්මක් තැනවීමේදී එය ශක්තිමත්ව නිර්මාණය කරගැනීම පිණිස පියවරගත් ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)